පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண சமூக சேவைகள் திணைக்களம் - வடமத்திய மாகாணம்
PROVINCIAL DEPARTMENT OF SOCIAL SERVICES – NORTH CENTRAL PROVINCE
372, ධර්මපාල මාවත, අනුරාධපුර. இல 372,தர்மபால மாவத்தை, அநுராதபுரம் NO. 372, Dharmapala Mawatha, Anuradhapura

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ பணிப்பாளர் Director | 025 - 2234673 | කාර්යාලය அலுவலகம் Office | 025 - 2224173 | ෆැක්ස් தொலைநகல் Fax | 025-2225316 |
| මගේ අංකය எனது இலக்கம் My No. | NCP/SS/E1/04-1 | ඔබේ අංකය உமது இலக்கம் Your No. | | දිනය திகதி Date | 2021/03/01 |


**පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 01/2016 (II)**

උතුරු මැද පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ
සියළුම සමාජ සේවා නිලධාරීන්/සංවර්ධන නිලධාරීන් වෙත

**වකුගඩු රෝගයෙන් අසරණ පවුල් පුනරුත්ථාපනය යටතේ වකුගඩු රෝගයෙන් මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මිය යන පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා සහන සැලසීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2016 හා 01/2016 (I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි. එම චක්‍රලේඛ අනුව රු.3000.00 ක මාසික ශිෂ්‍යාධාරයක් ගෙවිය හැක්කේ වකුගඩු රෝගය හේතුවෙන් මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මියගිය අඩු ආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා වේ. නමුත් එම ආධාර මුදල ඉල්ලුම් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන මරණ සහතිකයේ මරණයට හේතුව වකුගඩු රෝගය ලෙස සඳහන් නොවීම තුළ මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මිය යන තෙක් වකුගඩු රෝගීන් සඳහා සමාජ සේවා රේඛීය අමාත්‍යාංශය ගෙවනු ලබන රු.5000.00 ක මාසික වකුගඩු ආධාර මුදල ලබාගෙන තිබුණ ද ඔවුන්ගේ දරුවන්ට මෙම ආධාර මුදල ලබාදීමට හැකියාවක් නොලැබුණි. එබැවින් එම චක්‍රලේඛයේ 3.I.b, 3.I.c හා 3.I.e වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත වගන්ති මෙයින් ආදේශ කරනු ලැබේ.

3.I.b. මියගිය රෝගියා සමාජ සේවා රේඛීය අමාත්‍යාංශය මඟින් වකුගඩු රෝගීන් සඳහා ගෙවනු ලබන රු.5000.00 ක ආධාර මුදල ලැබූ රෝගියෙක් විය යුතුය.

3.I.c. ඉහත 3.I.b යටතේ දක්වා ඇති රෝගියා මෙම ශිෂ්‍යාධාර මුදල ඉල්ලුම් කරන දරුවාගේ මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු විය යුතුය.

3.I.e. ශිෂ්‍යාධාර මුදල අයදුම් කරන දරුවාගේ මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මියගොස් ඇති බවට හා මිය ගිය දිනය සනාථ කිරීම සඳහා මරණ සහතිකය හා දරුවාගේ භාරකාරීත්වය සනාථ කර ගැනීම සඳහා දරුවාගේ උප්පැන්න සහතිකය හා/හෝ නීත්‍යානුකූල භාරකාරීත්වය තහවුරු කරගත හැකි සහතික කළ ලිපි ලේඛන අයදුම්පතට ඇමිණිය යුතුය.

02. ඒ අනුව මරණ සහතිකයේ වකුගඩු රෝගයෙන්ම මිය ගිය බව සඳහන් නොවූවද සමාජ සේවා රේඛීය අමාත්‍යාංශය මඟින් වකුගඩු රෝගයට ගොදුරු වූවන් සඳහා ගෙවනු ලබන රු.5000.00 ක ආධාර මුදල ලබාගෙන ඇත්තේ නම් එසේ මව/පියා හෝ නීත්‍යානුකූල භාරකරු මිය ගිය අඩු ආදායම්ලාභී පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ද රු.3000.00 ක මාසික ශිෂ්‍යාධාර මුදල ගෙවීම් කිරීමට හැකි බවත් මෙම විධිවිධාන 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන බවත් මෙම සංශෝධිත චක්‍රලේඛය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත නිකුත් කරන බවත් මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

ඊ.පී.ජී.සී.කේ මඩුගල්ල,
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ,
පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව,
උතුරු මැද පළාත.

ඊ.පී.ජී.සී.කේ. මඩුගල්ල
පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
උතුරු මැද පළාත